# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2209/18 - 2021 ජනවාරි මස 05 වැනි අඟහරුවාදා - 2021.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන ම විසින් පනවනු ලබන රෙගුලාසි.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021, ජනවාරි මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2021 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම *ගැසට් පත්‍රයේ* නියම කර ඇති රෙගුලාසි අදාළ වන්නේ නෞභාර පත්‍රයේ/ ගුවන්භාර පත්‍රයේ දිනය ලෙස 2021 ජනවාරි මස 05 වැනි දින හෝ එදිනට පසු දිනක් සඳහන් වූ භාණ්ඩ ආනයනය කිරීම් සඳහා පමණි.

3. සංශෝධිත, 2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළකරන ලද 2020 ජූලි මස 16 දිනැති අංක 2184/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* **II** උපලේඛනයේ සඳහන් වූ පහත සඳහන් අයිතම සහ ඒවාට අනුරූපී සටහන් එම උප ලේඛනයෙන් ඉවත් කර, එකී *ගැසට් පත්‍රයේ* **I** උපලේඛනයට ඇතුළත් කරනු ලැබේ.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IVතීරුව තාවකාලික අත්හිටුවීම **(TS)** |
|---|---|---|---|---|---|
| **137** | **40.11** | | | රබර් වලින් නිමවූ, අළුත් වායු ටයර්. | |
| | | 4011.20.00 | - | බස් සහ ලොරි සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා: | |
| | | 4011.20.90 | --- | අනෙකුත් - රිම් ප්‍රමාණය අඟල් 12 සහ 13 පමණි | TS |
| | | 4011.40.00 | - | මෝටර් සයිකල් සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා (රිම් ප්‍රමාණය අඟල් 10, 12, 16, 17 සහ 18 පමණි) | TS |
| | | 4011.50.00 | - | සාමාන්‍යයෙන් බයිසිකල් සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා | TS |
| | | 4011.90.00 | - | අනෙකුත් : | |
| | | 4011.90.10 | --- | ත්‍රීරෝද රථ සඳහා භාවිතා කරන | TS |
| | | 4011.90.90 | --- | අනෙකුත් | TS |

01-344

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.